| | |
|---|---|
| මුළු ප්‍රශ්න සංඛ්‍යාව: | 07 |
| මුළු පිටු ගණන : | 02 |

500

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

**2011 විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි I කොටස පරීක්ෂණය**

**2014 මැයි**

**BME 1506 - ව්‍යාපාර නීතිය**

කාලය : පැය තුන (03) යි.

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් (07) සමන්විතය. ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න අංක 01**

පහත සඳහන් ඕනෑම හතර (04)ක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(i) නීතිය සහ සදාචාරය.

(ii) හරයාත්මක නීතිය සහ කාර්ය පටිපාටික නීතිය.

(iii) සිවිල් නීතිය සහ අපරාධ නීතිය.

(iv) නීති සහ අභිනියෝජිත නීති.

(v) ප්‍රතිවාදී සහ විමර්ශනවාදී ක්‍රමවේද. **(එකකට ලකුණු 05 බැගින් මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 02**

(i) සීමිත සමාගමක අධ්‍යක්ෂවරයකු වීම සඳහා 2007 අංක 7 දරණ සමාගම් පනතේ දක්වා ඇති සුදුසුකම් තුනක් (03) දක්වන්න. **(ලකුණු 03)**

(ii) අධ්‍යක්ෂවරයකුගේ යුතුකම් පහ (05)ක් සඳහන් කරන්න. **(ලකුණු 05)**

(iii) "ප්‍රධාන ගනුදෙනුවකට" (Major Transaction) සමාගමක් ඇතුළත් විය යුත්තේ කෙසේ ද? **(ලකුණු 06)**

(iv) සීමිත සමාගමක් සහ හවුල් ව්‍යාපාරයක් අතර ඇති මූලික වෙනස්කම් හය (06)ක් දක්වන්න. **(ලකුණු 06)**

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 03**

(i) සාප්පුවල භාණ්ඩ ප්‍රදර්ශනය කිරීම සහ භාණ්ඩ මත මිල සඳහන් කර සුපිරි වෙළෙඳ සැල්වල රාක්කවල භාණ්ඩ ප්‍රදර්ශනය කිරීම අර්පණ බව බොහෝ සාමාන්‍ය ජනතාව සිතයි. නමුත් නෛතික තත්ත්වය ඊට හාත්පසින් ම වෙනස් වේ. විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. **(ලකුණු 10)**

(ii) මිනීමරුවකු සිරභාරයට ගැනීමට සහ වරදකරු කිරීමට තුඩු දෙන තොරතුරු සඳහා තෑග්ගක් දීමට පොලීසිය අර්පණයක් කළේය. තෑග්ගක් දෙන බව නොදත් පැමිණිලිකරු පොලීසියට තොරතුරු සපයන ලදී. එම තොරතුරුවල ප්‍රතිඵලයක් ලෙස මිනීමරුවා සිරභාරයට ගන්නා ලදී. තෑග්ග සම්බන්ධව පසුව දැනගන්නට ලැබුණ පැමිණිලිකරු එය ඉල්ලා සිටියේය. පොලීසිය තෑග්ග දීම ප්‍රතික්ෂේප කළේය.

පැමිණිලිකරුට උපදෙස් දෙන්න. **(ලකුණු 10)**

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 04**

කුසුම් ඇයගේ මිතුරියක් වන නෙළුම් සමඟ ප්‍රදේශයේ පිහිටි සුපිරි වෙළෙඳ සැලකට ගියාය. ඔවුහු වෙළෙඳ සැලෙන් බිම්මල් පැකට් දෙකක් මිලදී ගත්තෝය. පැකැට්ටුවේ සඳහන් වූයේ බිම්මල් ඒ ආකාරයෙන් ම පිසීම සඳහා සුදුසු බව ය. ඔවුන් විසින් ඒවා පිළියෙල කර ආහාරයට ගන්නා ලදී. හදිසියේ ම බිම්මල් ව්‍යාංජනය තුළ මැරුණු ගොළුබෙල්ලෙකුගේ ශරීර කොටස් තිබෙනු නෙළුම් දුටුවා ය. මේවා තමන් ආහාරයට ගත් බව දැනගත් නෙළුම් අසනීප විය. පසුව අනාවරණය වූයේ බිම්මල් දුර පළාතක පිහිටි සමාගමක් මඟින් නිෂ්පාදනය කර ඇසුරුම් කර ඇති බවයි.

(i) නෛළුම්ට සුපිරි වෙළෙඳ සැලට එරෙහිව ලබාගත හැකි සහන මොනවා ද? **(ලකුණු 10)**

(ii) නෛළුම්ට බිම්මල් නිෂ්පාදනය කළ සමාගමට එරෙහිව ලබාගත හැකි සහන මොනවා ද?

**(ලකුණු 10)**

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 05**

(i) "චෙක්පතක්"යන්න අර්ථ නිරූපණය කර ගෙවීම් ක්‍රමයක් ලෙස චෙක්පතක ඇති වාසි හතර (04)ක් සඳහන් කරන්න. **(ලකුණු 04)**

(ii) ගනුදෙනු කළ හැකි ලියවිලිවල දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ මොනවා ද? **(ලකුණු 04)**

(iii) චෙක් පත්‍රයක් විනිමය බිල්පතක් හා සසඳන්න. **(ලකුණු 06)**

(iv) ගනුදෙනු කළ හැකි බව සහ පැවරිය හැකි බව පහදා දෙන්න. **(ලකුණු 06)**

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 06**

(i) "වෙළෙඳ ලකුණ" යන්න නිර්වචනය කර එහි විවිධ කාර්යන් හතරක් සඳහන් කරන්න.

**(ලකුණු 05)**

(ii) "ව්‍යාපාර නාමය" (Business name/Trade name) ආරක්ෂා කරගත හැක්කේ කෙසේ ද?

**(ලකුණු 05)**

(iii) ව්‍යාපාරිකයකු වන නිමල් මහතා ශල්‍ය කර්මයක් සඳහා මාස කිහිපයකට විදේශ ගත වීමට අපේක්ෂා කරයි. ඔහු සතු ව්‍යාපාරය, බැංකු ගිණුම් සහ ඉඩ කඩම් බලා කියා ගැනීමට සුදුසු පුද්ගලයකු පත් කිරීමට නිමල් මහතා බලාපොරොත්තු වේ. නියෝජිතයකු පත් කළ හැකි ආකාර ගැන විශේෂ අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාවේ ලිඛිතව නියෝජිතයකු පත් කිරීම සම්බන්ධයෙන් නිමල් මහතාට උපදෙස් දෙන්න. **(ලකුණු 10)**

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 07**

(i) සන්ධ්‍යා විසිතුරු බඩු සාප්පුවක යහළුවකු සඳහා තෑග්ගක් සොයමින් සිටී. ඇය රුපියල් 9999/= ක් ලෙස මිල සඳහන් කර ඇති ඉතාමත් අලංකාර වීදුරු ගුරුලේත්තුවක් තෝරා ගනී. ඉතා පරෙස්සමෙන් ගුරුලේත්තුව අතට ගත් ඇය සාප්පු සහායිකාව සිටින කවුන්ටරය වෙත පියමන් කරමින් සිටිය දී ඉදිරියෙන් දුවගෙන ආ වයස අවුරුදු 5ක පමණ වන දරුවකු ඇයගේ ඇඟේ හැපුණි. වීදුරු ගුරුලේත්තුව බිම වැටී දිලිසෙන කැබලි දහස් ගණනකට කැඩී ගියේය. මේ සිද්ධියෙන් ඇය මහත් අපහසුතාවයටත් ලැජ්ජාවටත් පත් වී සිටින අතර ඇය වෙත පැමිණි සාප්පු සහායිකාව මෙසේ කීය. "අපගේ වෙළෙඳ ප්‍රතිපත්තියට අනුව ඔබ විසින් දැනටමත් ගුරුලේත්තුව මිලදී ගෙන ඇති නිසා සම්පූර්ණ මිල ගෙවිය යුතුය".

සාප්පු සහායිකාව නිවැරදිදැයි ඔබ සිතන්නෙහි ද? ගිවිසුම් නීතියේ මූල ධර්ම අනුව ඔබගේ තීරණයට හේතු දක්වන්න. **(ලකුණු 10)**

(ii) පහත සඳහන් ඕනෑම මාතෘකා දෙක (02)ක් ගැන සටහන් ලියන්න.

(අ) ශ්‍රී ලංකාවේ නීති ක්‍රම.

(ආ) අධිකරණයේ ස්වාධීනත්වය.

(ඇ) ව්‍යාපාර කෙරෙහ ජාතික පාරිසරික පනතෙහි බලපෑම්. **(එකකට ලකුණු 05 බැගින්)**

**(මුළු ලකුණු 20)**

************************